# උපන් බිමේ අනාතයන් වීම තරම්...

**ගැ**ටුමකින් මතු උපදින ගැටලු, මානුෂික අයිතීන් උල්ලංඝනය කරන්නට තරම් දුර දිග ගොස් අර්බුදයක් බවට පත්වන්නේ නම් ඒ පිළිබඳ යම් වරදක් කොතැනක හෝ තිබිය යුතුය. දරුණු යුදමය පසුබිමක දී මේ තත්ත්වය, සාමාන්‍ය ගැටුම්කාරී පසුබිමක දී දුටුවාට වඩා කිහිප ගුණයකින් වර්ධනය වී ව්‍යාප්ත වනු ඇත.

සාමාන්‍ය ව්‍යවහාරයේ දී අනාතභාවය ලෙසත්, පුළුල් හෝ විද්වත් හෝ තලයේ දී සරණාගතභාවය ලෙසත් අර්ථ ගැන්වෙන අසරණ වූ මනුෂ්‍යයින්ගේ වත තුළ කිසිසේත් සුන්දරත්වයක් දැකිය නොහැකි ය. එහෙත් දීර්ඝ කාලයක් තිස්සේ සරණාගත තත්ත්වයෙන් කල් ගෙවීමට සිදු වීම උප සංස්කෘතීන් ද නිර්මාණය කිරීමට හේතු වී තිබේ. කෙසේ වෙතත් එය ඛේදයක් ලෙස සැලකිය හැකි ප්‍රවණතාවකි.

අන්තර් ජාතික වශයෙන් ද මෙම කරුණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු වනුයේ එය ඔඩු දුවා අර්බුදයක් බවට පත් ව ඇති බැවිනි. එසේ හෙයින් අන්තර් ජාතික සරණාගත දිනයක් ද නම් කර ඇත. ඉන් හෙළිවන කරුණුවලට අනුව ලොව පුරා සරණාගතභාවයට පත්වූවෝ මිලියන 21 ක් වෙසෙති. 2006 වසර අවසාන වන විට එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛනවලට අනුව එය මිලියන 32.9 කි.

එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසමේ මහාකොමසාරිස් අන්තෝනියෝ ගුටරීස් ගේ වදන්වලින් ම පැවසෙනුයේ ඉහත සංඛ්‍යාවෙන් අති බහුතරය විවිධ ගැටුම් හේතුවෙන් ඒ තත්ත්වයට පත්ව ඇති බව ය. ශ්‍රී ලංකාවේ ද ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් සරණාගතභාවයට පත්ව සිටින බව කියැවේ. කෙසේ නමුදු රජය සහ එල්ටීටීඊ සංවිධානය අතර වන ගැටුම් හේතුවෙන් අසහනයට පත් ව සිටින සංඛ්‍යාව මීට වඩා ඉහළ අගයක් ගන්නා බව ද සිහි කරනු වටී.

ශ්‍රී ලංකාවේ ගැටුම් ව්‍යාප්තවීමේ විවිධත්වය හේතුවෙන් කිහිපවරක් අවතැන්වීමේ ඛේදයට මුහුණ දෙන පිරිස් ද ඉහළ මට්ටමක සිටිති. සුනාමිය වැනි ස්වභාවික විපත් හේතුවෙන් අවතැන්වූවෝ පිළිබඳ වාර්තා කිරීමට ගිය අප හට ඒ හා සමාන උදාහරණ රැසක් හමු විය. සුනාමිය හේතුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි හි සිට යළි ඔල්ලිකුලම් ප්‍රදේශයට සරණාගතයන් ලෙසින් ගිය පිරිස අතර, යුද්ධය හේතුවෙන් ඉන් පෙර අනාථභාවයට ලක් ව සිටියෝ වූ හ. සරණාගත දිවියේ සිටින අතරතුර යළි සරණාගතභාවයට පත් වූ බවට ඒ එක් උදාහරණයක් පමණි.

අවතැන්වූවෝ පිළිබඳ ගැටලුව අද වන විට ලංකාවේ ද මානව හිමිකම් ගැටලු අතර, ප්‍රධාන තැනක් ගන්නා බව, ඒ සම්බන්ධ කටයුතු කරනු ලබන අමාත්‍යවරයා ද පිළිගත්තේය. කෙසේ වෙතත් යුද තත්ත්වය වර්ධනය වීමත් සමග මේ අර්බුදය උත්සන්න වන බව පැහැදිලිය. මේ සියලු කරුණු සත්‍ය වුවත් අප වටහා ගත යුතු කරුණ නම් මෙලෙස අසරණ වී සිටින පිරිස පිළිබඳව රටේ බොහෝ දෙනෙකු අඩු අවධානයකින් පසුවන බවය. එ නම් උපන් බිමේ දී ම සියල්ල අහිමිව ගොස් ජීවත්වීමේ අයිතිය පවා උදුරා ගැනීමට සැරසෙන, ව්‍යසනයන්ට ගොදුරුවූවන් නොසලකා හරිමින් සිටින බව ය.

අවතැන් වූවන් සොයා ගිය ගමනකදී අපට හමු වූ වාර්තා වැඩසටහන් ඡායාරූප ශිල්පියෙක් වන ගැමුණු අමරසිංහ දැක් වූ අදහස්වලින් බිඳක් මා මෙහි සටහන් කරනුයේ එහි වන අනුවේදනීයත්වය දරා ගැනීමට ඔබට ඇරයුම් කරමිනි.

"අවතැන්වූවන්ගේ තොරතුරු දැක්කම, මට දැනෙන්නෙ තනිවෙච්ච හැඟීමක්. අපි එක රටක ජීවත් වෙනව නම්  නැගෙනහිර සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක, අනෙක් පළාත්වල ඉන්න අය දැන ගන්න ඕන. ඒත් දකුණෙ ඉන්න අය එහෙ වෙන්නෙ මොකක්ද කියල දන්නෙ නැහැ. අනෙක් පැතිවලත් එහෙම තමයි. ඒක, කනගාටුදායකයි"

ගැමුණු අමරසිංහ අපට හමුවූයේ සරණාගතයන්ගේ ජීවන අවස්ථා නිරූපිත ඡායාරූප ප්‍රදර්ශනයකදී ය.

"අවසානයේ අපට, සරණාගතයන් ඉන් මුදවා ගැනීමට කළ හැක්කේ කුමක් ද? හෝ කළ යුත්තේ කුමක් ද? හෝ සිතා ගැනීමටවත් ඉඩක් නොතබා සරණාගත දින සැමරුම නිමා විය."

එසෙල සටහන් කොට අපට මොවුන්ගෙන් සමුගත හැකි ද? බොහෝ දෙනෙකු කරනු ලබන ආකාරයට එය කෙ තරම් සදාචාර සම්පන්න ද? යුද්ධය හා සාමය පිළිබඳ කථිකාවතේ දී මෙය ද තවත් එක් කඩ ඉමකි. එය තවත් පැහැදිලි කර ගත හැකි වන්නේ, තමන් උපන් බිමේ ම අනාථයන් වීම තරම් පාපයක් තවත් ඇති ද? යන්න මෙනෙහි කරන විට ය.

**ජනිත් විපුලගුණ**

2007 ජුලි 10